# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශේෂ

**අංක 12,835 — 1961 දෙසැම්බර් 27 වැනි බදාදා — 27.12.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : ඔ. 319/49.

සිතු ආචාර්ය තිං ඕං උතුමාණන් වහන්සේ බුරුම ජන රජයේ සුවිශේෂ හා පූර්ණ බලැ තානාපති වශයෙන් ලංකාවෙහි පෙනී සිටීමට බලය පවරනු ලැබූ අක්ත පත්‍රය, මහා රාජිණීන් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ බාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1961 දෙසැම්බර 22 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේදී.

12–1928

---

## මිල පාලන දැන්වීම්

**කේ. ඩී. අංක 97 දරණ ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශිය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන්පත් සිරිල් ජොසප් සේරසිංහ වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියත් සමහ කියවෙන 3 (2) වෙනි වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව—

(1) 1961 ජූනි මස 9 වෙනි දින හා අංක 12,460 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද 1961 ජූනි මස 2 වෙනි දින හා කේ. ඩී. අංක 89 දරණ ආහාර මිළ නියෝගයද 1961 ඔක්තෝබර් 10 වෙනි දින හා අංක 12,692 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1961 ඔක්තෝබර් 5 වෙනි දින හා මගේ අංක කේ. ඩී. 94 දරණ ආහාර මිළ නියෝගය ද මේ මොහොතේ සිට මේ නියෝගයෙන් වහාම අවලංගු කරමි.

(2) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස්වුනු කොළඹ නගරයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකළ පළමුවන උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරුවල සඳහන් ගණන් එකතු කිරීමෙන් එම පළමුවන උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සඳහා මහනුවර පාලක දිස්ත්‍රික්කයේ මහනුවර නගර සීමාව, ගඟවට කෝරළය සහ උඩුනුවර යටිනුවර ප්‍රාදේශිය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය තුළ විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන් ගත යුතුබව මෙයින් වහාම නියෝග කරමි.

(3) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස් වුනු කොළඹ නගරයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකළ දෙවන උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරුවල සඳහන් ගණන් එකතු කිරීමෙන් එම දෙවන උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සඳහා මහනුවර පාලන දිස්ත්‍රික්කයේ පාතහේවාහැට, පාත දුම්බර, මැද දුම්බර, හාරිස්පත්තුව, තුම්පනේ සහ උඩපළාත යන ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශ තුළ විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන් ගත යුතු බව මෙයින් වහාම නියෝග කරමි.

(4) 1950 අංක 29 දරණ ආහාර මිළ පාලන පනත යටතේ සකස් වුනු කොළඹ නගරයේ තොග වෙළන්දෙකුට තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන්වලට මෙයට යාකළ තුන්වන උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරුවල සඳහන් ගණන් එකතු කිරීමෙන් එම තුන්වන උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සඳහා (අ) මහනුවර පාලන දිස්ත්‍රික්කයේ උඩ දුම්බර සහ උඩබුලත්ගම යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශද (ආ) නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයද තුළ විකිණිය හැකි වැඩිම තොග සහ සිල්ලර මිළ ගණන් ගත යුතු බව මෙයින් වහාම නියෝග කරමි.

(5) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්.

(ආ) උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(6) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියමකරනු ලැබූ සෑම ප්‍රදෙශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනවල 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යය කිසි ප්‍රමාණයක් සුදුසු භාජනයකට දමා එම ද්‍රව්‍ය සඳහා මේ මිළ නියෝගයෙන් නියමකර ඇති වැඩිම් මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන්කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍ය සඳහා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව හා ප්‍රකටව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(8) එසේම, මේ නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත් නියම කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම් මිළ නියමකරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය බර අනුව ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(10) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබුවේ නම් හෝ බහාලනු ලැබුවේ නම් එහි මිළත් උපලේඛනවල 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් මිළ ගණන්වලට ඇතුලත්වන බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 20 වෙනි දින ප. ව. 3 ට මහනුවර කච්චේරියේදී අත්සන් කරන ලදී.

සී. ජේ. සේරසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ
උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ
නියෝජ්‍ය ආහාර මිළ පාලක තැන.

## පළමුවෙනි උපලේඛනය

(මහනුවර පාලන දිස්ත්‍රික්කයේ මහනුවර නගර සීමාව, ගඟවට කෝරළය සහ උඩුනුවර යටිනුවර ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශය)

| 1 වෙනි තීරය<br>විස්තරය | 2 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ දළ බර හොණ්ඩරයකට අය කෙරිය හැකි වැඩිම තොග මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. | 3 වෙනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ ශුද්ධ බර රාත්තලකට අය කෙරිය හැකි වැඩිම සිල්ලර මිළට එකතු කළ යුතු මුදල<br>රු. ශ. |
|---|---|---|
| ළූනු (රතු ළූනු හැර වික්බෙලාපූර් හැර වෙනත් සියලුම) | 2 0 | 0 2 |
| අර්තාපල් | 2 0 | 0 2 |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් | 2 0 | 0 2 |
| සුදුළූනු (බොම්බේ) | 3 0 | 0 3 |
| වියලි මිරිස්— | | |
| එම සන්නම් 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්නම් 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්තකා | 4 0 | 0 4 |
| එම නන්දබාර් | | |
| එම අකෝලා | | |
| එම සියම් | | |
| එම ජාවා | | |
| සූදුරු | 3 0 | 0 3 |
| කහ | 3 0 | 0 3 |
| කොත්තමල්ලි | 3 0 | 0 3 |
| පියලි නොකළ උලුඳු | 2 0 | 0 2 |
| මුංඇට | 3 0 | 0 3 |
| තෝර පරිප්පු | 2 0 | 0 2 |
| කඩල පරිප්පු | 3 0 | 0 3 |
| වික්පීස් | 3 0 | 0 3 |
| සියඹලා | 3 0 | 0 3 |

## දෙවෙනි උපලේඛනය

(මහනුවර පාලන දිස්ත්‍රික්කයේ පාතහේවාහැට, පාත දුම්බර, මැද දුම්බර, හාරිස්පත්තුව, කුම්පනේ සහ උඩපළාත යන ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ)

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| විස්තරය | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ දළ බර හොණ්ඩරයකට අය කෙරිය හැකි වැඩිම තොග මිළට එකතු කළ යුතු මුදල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ ශුද්ධ බර රාත්තලකට අය කෙරිය හැකි වැඩිම සිල්ලර මිළට එකතු කළ යුතු මුදල |
| | රු. ශ. | රු. ශ. |
| ළූනු (රතු ළූනු සහ බික්බෙලාපුර් හැර වෙනත් සියලුම) | 2 20 | 0 3 |
| අර්තාපල් | 2 20 | 0 3 |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් | 2 20 | 0 3 |
| සුදුළූනු (බොම්බෙ) | 3 20 | 0 4 |
| වියළි මිරිස්— | | |
| එම සන්නම් 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්නම් 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්තකා | 4 20 | 0 4 |
| එම නන්දබාර් | | |
| එම අකෝලා | | |
| එම සියම් | | |
| එම ජාවා | | |
| සුදුරු | 3 20 | 0 4 |
| කහ | 3 20 | 0 4 |
| කොත්තමල්ලි | 3 20 | 0 4 |
| පියළි නොකළ උලුඳු | 2 20 | 0 3 |
| මුංඇට | 3 20 | 0 4 |
| තෝර පරිප්පු | 2 20 | 0 3 |
| කඩල පරිප්පු | 3 20 | 0 4 |
| චික්පීස් | 3 20 | 0 4 |
| සියඹලා | 3 20 | 0 3 |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ ගණන් නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැක.

## තුන්වෙනි උපලේඛනය

((අ) මහනුවර පාලන දිස්ත්‍රික්කයේ උඩ දුම්බර සහ උඩ බුලත්ගම යන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශද (ආ) නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශය)

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| විස්තරය | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ දළ බර හොණ්ඩරයකට අය කෙරිය හැකි වැඩිම තොග මිළට එකතු කළ යුතු මුදල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණීමේදී කොළඹ නගරයේ ශුද්ධ බර රාත්තලකට අය කෙරිය හැකි වැඩිම සිල්ලර මිළට එකතු කළ යුතු මුදල |
| | රු. ශ. | රු. ශ. |
| ළූනු (රතු ළූනු සහ බික්බෙලාපුර් හැර වෙනත් සියලුම) | 2 40 | 0 3 |
| අර්තාපල් | 2 40 | 0 3 |
| අර්තාපල් (ඉන්දියානු) මෙට්ටුපාලයම් | 2 40 | 0 3 |
| සුදුළූනු (බොම්බෙ) | 3 40 | 0 4 |
| වියළි මිරිස්— | | |
| එම සන්නම් 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්නම් 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 1 වෙනි ශ්‍රෙණිය | | |
| එම මුන්ඩු 2 වෙනි ශ්‍රෙණිය | | |
| එම සන්තකා | 4 40 | 0 5 |
| එම නන්දබාර් | | |
| එම අකෝලා | | |
| එම සියම් | | |
| එම ජාවා | | |
| සුදුරු | 3 40 | 0 4 |
| කහ | 3 40 | 0 4 |
| කොත්තමල්ලි | 3 40 | 0 4 |
| පියළි නොකළ උලුඳු | 2 40 | 0 3 |
| මුංඇට | 3 40 | 0 4 |
| තෝර පරිප්පු | 2 40 | 0 3 |
| කඩල පරිප්පු | 3 40 | 0 4 |
| චික්පීස් | 3 40 | 0 4 |
| සියඹලා | 3 40 | 0 4 |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ ගණන් නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැක.

ආර්/ 21/1961 වැනි අංක දරණ මිළ (ආහාර) නියෝගය — සහල්

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1959 ජුනි මස 26 වෙනි දින අංක 11,790 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනලද 1959 ජුනි මස 22 වෙනි දින අංක ආර්/ 23/1959 දරණ මගේ ආහාර මිළ නියෝගය අද දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) සහල් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් මිට යාකොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන් ඇතුළත තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ අද දින පටන් මෙහිම 2 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) සහල් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් මිට යා කොට ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශ සීමාවන් ඇතුළත සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ අද දින පටන්, මෙහිම 3 වෙනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් වන අතරම ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සහල් නොවිකිණිය යුතුබව මෙයින් නියෝග කරමි.

(4) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සහල් ශුද්ධ බර හොණ්ඩරයකට වඩා වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;

(ආ) සහල් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, සහල් විකුණන විට එය යම්කිසිදෙයක ඔතා හෝ බහා දෙන දෙයක් වෙතොත් එහි මිළත් මෙම නියෝගයෙන් නියම කරනලද වැඩිම මිළ ගණන්වලට ඇතුළත් බවද මෙයින් නියෝග කරමි.

(7) තවද, යම් ස්ථානයක හෝ වාහනයක හෝ සහල් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම සහල් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන්කොට එම භාජනයට සම්බන්ධකොට එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබියයුතු බව නියම කරමි.

(8) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යනුවෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සහල් ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 20 වෙනි දින පස්වරු 4ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයකට අයකළ හැකි වැඩිම තොගමිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තල් 2කට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| (1) නවදුන් කෝරළය— | | |
| (අ) තිරිවානාකැටිය, බටුගෙදර නගර සභා ප්‍රදේශය, මාරපොන (කරන්ත පාරෙහි), පැල්වාඩිය, කැටන්දොල, දෑල, නිවිතිගල වසම්, වටාපොත, ඇලපාත, අලු කැටිය, ඇත්ඕය (නගර සභා ප්‍රදේශයෙන් පිටත) සහ ගැටන්ගම (නගර සභා ප්‍රදේශයෙන් පිටත) ... | 13 87 | 0 26 |
| (ආ) පැල්මඩුල්ල, මීගහගොඩ, බත්ගන්ගොඩ, පාතකඩ, මිදිගහමුල්ල, කාමරංගාපිටිය, මොරතොට, කුට්ටාපිටිය, නාරංගොඩ, ගනේගම, බෝපිටිය, රිල්හේන, කෙටේතැන්න, පනාවැන්න, ලෙල්ලෝපිටිය, බැරැන්ඩුව, දිප්පිටිගල, පනගම, වැලිමලුව, ගෝනාකුඹුර, හකමුව, මාරපොන, (ගහෙන් එගොඩ), කොලොන්ඩගල, කරවිට, පැබොටුව, එරබැද්ද, කිරිබත්ගල, දෙලෝස්වල වසම, වේරගම, අමුවල වසම, උඩවටන, පොරගිරිගම, වැරනියගොඩ සහ දෙමළ පෝරුව ... | 13 97 | 0 26½ |
| (ඇ) සන්නස්ගම, පෝරෝනුව, බෝපැත්ත, දෙල්වල, මිල්ලවිටිය, කෙහෙල්ඕවිටිගම, දෙල්ලබොඩ, රද්දැල්ල, හංගොමුව, කුලාවෙල, කුරංගොඩ, නිරිඇල්ල, ගල්ලැල්ල, නුගේපොල සහ හපුරුපොල ... | 14 08 | 0 27 |
| (ඈ) බුලත්වත්ත, ඉල්ලුබුළුව, දිමියාව, දඹුළුවන සහ හපුගස්තෙන්න ... | 14 19 | 0 27½ |
| (ඉ) ගුරුබැවිලෙගම, කොකටියවෙල සහ ඉහතින් සඳහන් නොකළ සෑම ප්‍රදේශයක්ම ... | 14 29 | 0 28 |
| (2) කුරුවිටි කෝරළය— | | |
| (අ) රත්නපුර නගරසභා ප්‍රදේශය සහ වෙරලුපේ ... | 13 87 | 0 26 |
| (ආ) ඇහැලියගොඩ, කඳන්ගොඩ, කුරුවිට, හිඟ්ගස්හේන, එක්නෙලිගොඩ, කැන්දන්ගොමුව ඊවුම, පැල්පිටිය, තොරණ කඩ, විලේගොඩ, බුළුගහපිටිය, කැන්දන්ගොමුව පහළගම, කැන්දන් ගොමුව ඉහළගම සහ මින්නාන ... | 13 70 | 0 26 |
| (ඇ) මිල්ලවිටිය, කොක්කෝවිට, පුස්ඇල්ල වතුයාය, ක්රන්ඩන් වතුයාය, බටුහේන, මාන්ගෙදර, ඒදණ්ඩවෙල, ගෝනාපිටිය, තැඹිලියාන, කොස්ගල, ඉද්දමල්ගොඩ, පරනගම, පහලකන්ද, අකුරණ, පෙහොරබාව, තලාපිටිය, දිගෝගෙදර, එල්ලාවල, බෝඩිමලුව, කිරිපෝරුව, මුක්තෙට්වූපිටිය, පනුකැරපිටිය, මලංගම, මීහිටිය, කහන්ගම, දේවාලෙගාව, හොලිපිටිය සහ මල්වල ... | 13 87 | 0 26½ |

## උපලේඛනය—සම්බන්ධයි

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයකට අයකළ හැකි වැඩිම තොග මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තල් 2කට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| (ඇ) වැලිකඹුර, බටහිරකරඳන, නුගදන්ඩ, වැවිල, ඇල්ලෙගෙදර, දෙඩම්පෙ, බලගන්ගොඩ, දූරෙගෙ කන්ද, ඉලුක්වත්ත, පාගොඩ, තැන්නෙහේන, ඉඹුල්දෙනිය, ගුරුළුවාන, මැදගම, යටිපව්ව සහ ඇල්ලගාව | 14 11 | 0 27 |
| (ඉ) කිරිඇල්ල | 14 22 | 0 27 |
| (ඊ) හල්පෙ, දෙවිපහල තෙප්පනාව, නැඳුරන, ඇරැපොල, තුම්මෝදර, මාවුවාගල, එපිට වල, මැද කන්ද, කහවත්ත, පල්ලෙපත්තු සහ නැගෙනහිර කරඳන | 14 19 | 0 27½ |
| (උ) හිඳුරන්ගල ගැටහැත්ත, දුරම්පිටිය, නාපාවල, මාරඹෙ, ඉලුක්පිටිය, මාරඹෙකන්ද සහ හේවා හින්නේ කන්ද | 14 29 | 0 28 |
| (ඌ) අඩවිකන්ද මුත්තෙට්ටුවේ කන්ද, ගහ ඩොබ සහ පලාබද්දල | 14 39 | 0 28½ |
| (එ) කුඩාව | 14 49 | 0 29 |
| (ඒ) කොස්ගහකන්දෙවත්ත සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ | 14 59 | 0 29½ |
| **(3) කඩවත සහ මැද කෝරළය—** | | |
| (අ) ඔපනායක ගම්සභා වවුම, හුනුවල, උඩවෙල, මාදෙල, හොරකැටිය, ඔපනායක වසම සහ අකරැල්ල | 13 87 | 0 26 |
| (ආ) පනාන | 13 97 | 0 26½ |
| (ඇ) කොත්ගස්තැන්න, කන්දෙකැටිය, බලන්ගොඩ නගර සභා ප්‍රදේශය, බලන්ගොඩ වසම, කිරිමැටිතැන්න වසම, දිගදූරෙ, මස්හේන වසම, අමුපිටිය, රත්මලවින්න, ඇල්ලෙඅරාව සහ ඔලුගන්තොට | 14 18 | 0 27 |
| (ඈ) මහවලතැන්න, ගල්ගොඩලහ, හතර බාගේ, මොරහැල, කෙසෙල්කොරටුව, කිරුපනාවල, වෙගපිටිය, රාස්සගල, වසම, ඉඹුල්පෙ, අලුත්නුවර, දෙපලමුල්ල, වැලිගෙපොල, නෙල්ලිවල, මාරතැන්න, පඹගොල්ල, ගලගම වසම, පුවක්ගහවෙල, දෙනගම, හල්පෙ වසම, පන්නවල, කනතිරියන්වෙල, උඩගල් අරාව, අටවක්වෙල සහ බොල්තුඹෙ වසම | 14 36 | 0 27½ |
| (ඉ) ඌරවෙල, තන්ගම, නොන්පෙරිල් ගෘප්, බෙලිහුල්ඔය සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ | 14 46 | 0 29 |
| **(4) අටකලං කෝරළය—** | | |
| (අ) කහවත්ත ගම්සභා වවුම සහ නුගවෙල | 13 87 | 0 26 |
| (ආ) අටකලංපන්න, යාහින්න, කොටකෙතන, නැබුලුව, බුංගිරිය, වෙල්අඳුර, හපුරුදෙනිය සහ දිඹුල්වෙල | 13 94 | 0 26½ |
| (ඇ) යටාගර, හොරහින්ඇල්ල, හවුපෙ, රිදීවිට, හිරමඩගම, කලල්ඇල්ල, ඇල්පිටිය, මාදම්පෙ, ඇන්දන සහ පනාපිටිය, රක්වාන සුළු නගර සභා ප්‍රදේශය සහ රක්වාන වසම | 14 32 | 0 27 |
| (ඈ) ගොඩකවෙල, වෙරහැර, මල්වත්ත, මස්ඉඹුල, ඇමටියගොඩ, ගලහිටිය, පල්ලෙගම සහ කොස් නාතොට | 14 19 | 0 27 |
| (ඉ) මඩලගම, මාකඳුර, පනාවල, ගහලවෙල, හපුගස්තෙන්න, පල්ලෙවෙල, කොස්වැටිය, බලවින්න සහ පල්ලේබැද්ද | 14 29 | 0 27½ |
| (ඊ) පන්නිල, නාවින්න, පලම්කෝට්ටෙ, පිටවල සහ තිඹොල්කැටිය | 14 39 | 0 28 |
| **(5) කුකුල් කෝරළය—** | | |
| (අ) සිංහලගොඩ, ඉන්දෙලවත්ත සහ උක්වත්තකන්ද | 14 39 | 0 27 |
| (ආ) කොස්වත්ත, කලවාන, වේවැල්කඳුර, අයගම, නම්මුනියාවත්ත, ගලතුරේ, කන්ද වත්ත, ඇරැ පෝරුව, පල්ලෙකන්ද, මඩබද්දර දුම්බර සහ කැටේපොල | 14 39 | 0 27½ |
| (ඇ) වැද්දගල, පනහැටගල (නවදුන් කෝරළේ), දෙලකන්ද | 14 49 | 0 28½ |
| (ඈ) ගවරගිරිය සහ කන්ලෙන | 14 59 | 0 29½ |
| (ඉ) පනාපොල සහ ඉහතින් සඳහන් නොකළ සියලුම ප්‍රදේශ | 14 69 | 0 30 |
| **(6) කොළොන්නා කෝරළය—** | | |
| (අ) සූරිය කන්ද, බුලුතොට, ඉත්තැකන්ද සහ පොද්දන | 14 92 | 0 28½ |
| (ආ) විජේරිය, කොළොන්න, හල්වින්න, හෙල උඩ කන්ද, ඇඹිලිපිටිය, පල්ලෙගම, ඉහළ ගම පන්නිල් කන්ද, කොස්තනගහවත්ත සහ බොරලුවෙගෙ අයින | 14 59 | 0 29 |
| (ඇ) කෝප්ප කන්ද සහ ඉහතින් සඳහන් නො කළ සියලුම ප්‍රදේශ | 14 69 | 0 30 |

සැළකිය යුතුයි.—(1) මෙ මිළ ගණන් සහල් විකිණීමෙ නියමිත මිළ නොවේ. මේවා සහල් විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට වඩා වැඩියෙන් සහල් විකිණිය නොහැක.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු යම්කිසි සහල් ප්‍රමාණයක් තොග වශයෙන් විකිණීමේදී ගෙවිය හැකි වැඩිම මිළ, ඉහත සඳහන් කර තිබෙන ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ ප්‍රමාණයන් අනුව ගණන් බලාගත් මිළ විය යුතුයි.

12—1926

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.